+

## පාර්ලිමේන්තු මහා මැතිවරණය - ශ්‍රී ලංකාව 2020

### කොවිඩ් 19 වසංගත පසුබිම තුළ මැතිවරණ නිරීක්ෂකයන් සඳහා වන ආචාරධර්ම පද්ධතිය - කෙටුම්පත

මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වන අප, වර්ෂ 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළව මැතිවරණ නිරීක්ෂණ කටයුතු දියත් කිරීමට සැලසුම් කර ඇති අතර දැනට පැතිරෙමින් පවත්නා කොවිඩ් - 19 වසංගත තත්ත්වයෙහි බරපතලභාවය මෙන්ම එකී වෛරසය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා සහයෝගය දැක්වීමේ වගකීම ද මනා ලෙස අවබෝධ කරගනු ලැබ ඇත්තෙමු.

මැතිවරණ නිරීක්ෂකයන් යනු, ප්‍රජාතන්ත්‍රවාදී සහ විනිවිදභාවයකින් යුත් මැතිවරණ ක්‍රියාවලියක් හා බද්ධ වූ පිරිසක් වන අතර අද වන විට අප මුහුණ දී සිටින්නා වූ අනපේක්ෂිත තත්ත්වය අභිමුව වුවද නිරීක්ෂක කාර්යයභාරය එලෙසම නොවෙනස්ව පවතී. එහිලා අපගේ කාර්ය හා කර්තව්‍යයන් සම්බන්ධයෙන් ගත්කල ඊට අදාළ කලාපීය හා අන්තර්ජාතික ප්‍රමිතීන් උපරිම අන්දමින් අනුගමනය කිරීම සඳහා ඇපකැපවී සිටින්නෙමු.

එහෙයින් අදාළ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය වඩාත් ආරක්ෂාකාරී අන්දමට සිදු කෙරන බව මෙන්ම එහිදී කිසිදු ලෙසකින් ඡන්දදායකයන්, මැතිවරණ කාර්ය මණ්ඩල සාමාජිකයන් හෝ අනෙකුත් පාර්ශවකරුවන් ආදී වශයෙන් වූ කවරෙකුට වුවද අගතිදායක නොවන අන්දමින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් මැතිවරණ නිරීක්ෂණ කටයුතු හා සබැඳි අප ආයතන අදාළ කාර්යකර්තව්‍යයන්හි නියැලීමේදී අනුගමනය කිරීම උදෙසා පහත ඉදිරිපත් කර ඇති මාර්ගෝපදේශ සාමූහික ප්‍රයත්නයක් ලෙසින් ඒකාබද්ධව සකසනු ලැබ ඇත.

1. කොවිඩ් - 19 සම්බන්ධයෙන් සෞඛ්‍ය අධිකාරීන්, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව සහ අනෙකුත් රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන්නා වූ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම සඳහා නිරීක්ෂණ ආයතන ලෙස අපි කැපවන්නෙමු. අපගේ ආයතනයන්හි කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ස්වේච්ඡා සාමාජිකයන් අදාළ ප්‍රතිපත්ති හා අනුගතව ක්‍රියා කරනු ලබන බව සහතික කරන අතරම ඒ සම්බන්ධයෙන් ඔවුන් කාලානුරූපීව දැනුම්වත් කිරීමද සිදු කරනු ලැබේ.

2. භෞතික වශයෙන් පුද්ගල හමුවීමේ අවශ්‍යතා හැකිතාක් දුරට අවම කිරීම උදෙසා මාර්ගගතව (Online) සන්නිවේදන කටයුතු සිදු කිරීම සඳහා අපි හැම විටම නිසි ප්‍රමුඛතාවය ලබා දෙන්නෙමු.

3. සෑම අවස්ථාවකදීම අවම වශයෙන් මීටරයක් දුර සමාජ දුරස්ථභාවයක් (Social Distance) පවත්වා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් අපගේ ආයතනයන්හි කාර්යමණ්ඩල සාමාජිකයින්ට සහ ස්වේච්ඡා සාමාජිකයින්ට ලබා දීමට කටයුතු කරනු ලැබේ. එකී සියලු අවස්ථාවන්හි දී භෞතික වශයෙන් පුද්ගලයන් එකිනෙකා හා සිදුවිය හැකි ස්පර්ශය වළකාලීමට අවැසි කටයුතු සම්පාදනය කරනු ලැබේ.

4. නිරන්තරයෙන් ස්වකීය දෑත් සබන් හෝ විෂබීජනාශක යොදා පිරිසිදු කර ගැනීම සඳහා උපදෙස්, අපගේ ආයතනගත කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සහ ස්වේච්ඡා සාමාජිකයන්ට ලබාදෙනු ලැබේ.

5. පොදු ස්ථානයන්හි දී අපගේ ආයතනගත කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ස්වේච්ඡා සාමාජිකයන් මුඛ ආවරණ පැළඳිය යුතු වන්නා සේම ඒවා නිසි පරිදි පැළඳීම සඳහා අවැසි අවශ්‍ය උපදෙස් ද ලබාදෙනු ලැබේ.

6. හැකි සෑම අවස්ථාවකදීම පොදු ප්‍රවාහන සේවා භාවිතය අවම කරගැනීම සඳහා අවශ්‍ය උපදෙස් අපගේ ආයතනගත කාර්යමණ්ඩල සාමාජිකයන්ට සහ ස්වෙච්ඡා සාමාජිකයන්ට ලබාදෙනු ලැබේ. පෞද්ගලික වාහන භාවිතා කිරීමට පෙර සහ පසු ඒවා ජීවාණුහරණය කිරීම ද නිතැතින්ම සිදු කරනු ලැබේ.

7. යම් හෙයකින් පුද්ගල සබඳතා පැවැත්වීම හා සබැඳි කරුණු පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ අවශ්‍යතාවක් අදාළ සෞඛ්‍ය අංශ වෙතින් මතු වුවහොත්, ඊට අදාළ තොරතුරු ලබාදීමේ අරමුණින් යුක්තව තම තමන් ආගිය ස්ථාන සහ හමු වූ පුද්ගලයන් පිළිබඳ දත්ත ද ඇතුළත්ව, ස්වකීය ක්‍රියාකාරකම් පිළිබඳ දෛනික ලොග් වාර්ථා සටහන් පවත්වාගෙන යෑම අපගේ ආයතනගත කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ස්වෙච්ඡා සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

8. අපගේ ආයතනගත කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ස්වෙච්ඡා සාමාජිකයන් වෙත ප්‍රමාණවත් සෞඛ්‍ය රක්ෂාවරණ ලබාදීමට සෑම උත්සහයක්ම ගනු ලැබේ. තවද සෞඛ්‍ය අංශයෙහි වෘත්තිකයන්ගේ සහයෝගය සහිතව අප නිරීක්ෂකයන්ගේ සෞඛ්‍ය තත්වය නිරන්තර පරීක්ෂාවට භාජනය කිරීම ප්‍රමුඛතාවක් සේ සළකනු ලබන අතර යම් හෙයකින් කොවිඩ්-19 වෛරස් රෝග ලක්ෂණ පෙන්නුම් කෙරෙන කවර තැනැත්තෙක් හෝ වේවා එවන් පුද්ගලයෙකු/පුද්ගලයන් ස්වයං නිරෝධායනයට ලක් කිරීම සඳහා අවැසි කටයුතු සම්පාදනය කෙරේ.

අනුමත කරන ලද්දේ:

- නිදහස් මැතිවරණ සඳහා වන ආසියානු ජාලය - Asian Network for Free Elections (ANFREL)
- නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ව්‍යාපාරය - Campaign for Free & Fair Elections (CaFFE)
- මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය - Center for Monitoring Election Violence (CMEV)
- ලක්බිමේ මව්වරු සහ දියණියෝ - Mothers & Daughters of Lanka (MDL)
- නිදහස් සාධාරණ මැතිවරණ සඳහා ව්‍යාපාරය - Movement for Free and Fair Elections (MFFE)
- ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය - National Polls Observation Centre (NPOC)
- නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ජනතා ක්‍රියාකාරීත්වය - People’s Action for Free and Fair Elections (PAFFREL)

## කොවිඩ් 19 වසංගත පසුබිම තුළ මැතිවරණ නිරීක්ෂකයන් සඳහා වන ප්‍රතිඥාව

1. කොවිඩ් 19 හා සබැඳිව සෞඛ්‍ය අධිකාරීන්, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව මෙන්ම අනෙකුත් රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති අනුගමනය කිරීමට මම කටයුතු කරන්නෙමි.

2. කොවිඩ් 19 හා සබැඳිව මාගේ ආයතනය විසින් නිකුත් කර ඇති උපදෙස් අනුගමනය කිරීමට මම කටයුතු කරමි.

3. සෑම අවස්ථාවකදීම අවම වශයෙන් මීටරයක දුරක සමාජ දුරස්ථභාවය පවත්වාගත යුතුබව මම අවබෝධකරගෙන සිටිමි. සෑම අවස්ථාවකදීම භෞතික වශයෙන් පුද්ගලයින් එකිනෙකා හා සිදුවිය හැකි ස්පර්ශයෙන් වැළකීමට මම ක්‍රියා කරන්නෙමි.

4. මාගේ දෑත් සබන් හෝ විෂබීජනාශක යොදා පිරිසිදු කර ගැනීමට නිරන්තරයෙන් ක්‍රියා කරන්නෙමි.

5. නිසි පරිදි මුඛ ආවරණ පැළඳිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලැබුණු අතර පොදු ස්ථානයන්හි දී මුඛ ආවරණ පැලඳීමට ක්‍රියා කරන්නෙමි. මූලික ආරක්ෂිත උපාංග භාවිත නොකරන අවස්ථාවන්හි දී ඡන්ද මධ්‍යස්ථාන, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන හෝ අනෙකුත් පහසුකම් වෙත ප්‍රවේශ වීමට මා හට ඉඩ ප්‍රස්ථාව අහිමිවිය හැකි බව මා අවබෝධ කරගෙන සිටින්නෙමි.

6. හැකි සෑම අවස්ථාවකදීම පොදු ප්‍රවාහන සේවා භාවිතය අවම කරගැනීම සඳහා මම උත්සහ කරමි.

7. පෞද්ගලික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ මාගේ ආයතනය නිරතුරුව දැනුම්වත් කිරීමට පියවර ගනිමි. යම් ලෙසකින් කොවිඩ්-19 වෛරස් රෝග ලක්ෂණ මා තුළින් පෙන්නුම් කෙරෙන්නේ නම් මා ස්වයං නිරෝධායනයට ලක් විය යුතු බව මා ද අවබෝධ කරගෙන සිටින්නෙමි.

8. යම් හෙයකින් පුද්ගල සබඳතා පැවැත්වීම හා සබැඳි කරුණු පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ අවශ්‍යතාවක් අදාළ සෞඛ්‍ය අංශ වෙතින් මතු වුවහොත්, ඊට අදාළ තොරතුරු ලබාදීමේ අරමුණ ඇතිව මවිසින්, ආගිය ස්ථාන සහ හමු වූ පුද්ගලයන් පිළිබඳ දත්ත ද ඇතුළත්ව මා හා සබැඳි ක්‍රියාකාරකම් පිළිබඳ දෛනික ලොග් වාර්තා සටහන් පවත්වාගෙන යෑමට මම කටයුතු කරමි. කෙසේවුවද, මා මැතිවරණ නිරීක්ෂකයෙකු වශයෙන් ලබාගන්නා සම්මුඛ සාකච්ඡා හෝ වෙනත් අදාළ සාකච්ඡාවන්හි අන්තර්ගත තොරතුරු කිසිවක් අනාවරණය කිරීමට කටයුතු නොකරන්නෙමි.

9. මාගේ ආයතනය මගින් නිකුත් කර ඇති හැඳුනුම්පත මවිසින් අවභාවිත නොකරනු ලබන බව ද ප්‍රකාශ කරමි.

කොවිඩ් 19 වසංගත පසුබිම තුළ මැතිවරණ නිරීක්ෂකයන් සඳහා වන ආචාරධර්ම පද්ධතිය මවිසින් පිළිගනු ලබන අතර මාගේ ආයතනය මගින් අවශ්‍යයැයි සලකනු ලබන වඩාත් සුදුසු කවර හෝ පසුබිමක් වේද ඊට අනුගත වීමට මා මෙමගින් එකඟ වෙමි.

නම:

දිනය:

අස්සන:

*සටහන: ස්වකීය ආයතනයන්හි කාර්යමණ්ඩල සාමාජිකයන්ට සහ ස්වේච්ඡා සාමාජිකයන්ට කොවිඩ් 19 වසංගත පසුබිම තුළ මැතිවරණ නිරීක්ෂකයන් සඳහා වන ආචාරධර්ම පද්ධතියෙහි කරුණු අනුගමනය කිරීමට හැකිවන පරිදි ඉහත ආකෘතිය සුදුසු පරිදි භාවිතා කලහැකිය.*